# තාරුණ්‍ය මගින් ආපදා අවම කිරීමේ

## (වකයාමා ප්‍රකාශනය)

ආපදා අවම කිරීමේ අධ්‍යයනය සඳහා වු ආසියානු තරුණ සම්මේලනය වකයාමා ප්‍රාන්තයේ , අධ්‍යාපන සභාව, ( යුනෙස්කෝ ) එක්සත් ජාතීන්ගේ අධ්‍යාපනණී සමාජ, සංස්කෘතික, සංවිධානය වෙනුවෙන් ආසියා / පැසිෆික් සංස්කෘතික මධ්‍යස්ථානය හා ඉනමුරා-නොහි සභාව වෙනුවෙන්වු සංවිධාන කමිටුව මගින් සංවිධානය කරණු ලැබූ, ආපදා අවම කිරීමේ ආසියානු තරුණ සමුළුවට සහභාගී වන රටවල් නියෝජනය කරණ තරුණ නියෝජිතයන් වන අප , 2006 නොවැම්බර් දෙවැනි දින මෙසේ ප්‍රකාශ කර සිටිමු.

01 ආපදා සිදුවන්නේ අනපේක්ෂිතවය , එහෙත් ඉන් ඇතිවන සිද්ධි සහයෝගයෙන් හා සුදානම්ව සිටීමෙන් අවම කර ගත හැක.

02 ආපදා වලින් නිදහස්ව සිටීම මුලික මිනිස් අයිතිවාසිකමකි.

03 ආපදා අවම කිරීමට අප සියල්ලෝම වගකිමෙන් බැඳී සිටිති.

04 ආපදාවක් සිදුවීමට පෙර දැනුවත් වී සිටීම හා විධිමත්ව සුදානම්වීම අත්‍යවශ්‍යය“

05 ආපදා පිළිබඳව අතීතයෙන් ලබාගත් පල පුරුද්ද , පාරම්පරික දැනුම හා පර්යේෂණ තුලින් රැස්කර ගත් තොරතුරු මුලු ලොව තුලම බෙදා හදා ගැනිම වැදගත්වේ.

06 අපගේ පරිසරය සංරක්ෂණය කර ගැනිම තුලින් ලොව ඇතිවන ආපදා වැලැක්වීමට හා එම ආපදා වලින් සිදුවන හානිය අවම කිරීමට ඉවහල් වේ.

07 ආපදා අවම කිරීමේ අධ්‍යාපනය මගින් ජීවිත හානි සිදුවීම අවම කිරීමල දේපල වලට හා පරිසරයට වන හානි අවම කිරීමටත් , ආපදා වලට පත්වූවන්ට උදව් කිරීමටත් හැකිවේ.

08 ආපදා අවම කිරීමේ අධ්‍යයනය අපගේ අධ්‍යාපන පද්ධතියේ වැදගත් අංශයක් විය යුතුය. එය පාසල තුල හා පිටත සිටින ළමුන්ට විවෘත විය යුතුය.

09 සෑම දෙනාම ආපදා අවම කිරීම පිළිබඳව ශක්තිකරණය ලබාගත යුතුය. විශේෂයෙන් ළමුන්ට වැඩිහිටියන්ට හා ආබාධිත පුද්ගලයින්ට වඩාත් බලපානු ඇත.

10 ආපදා වලට හදිසි ප්‍රතිකර්ම ආපදාවලට පත්වුවන්ට ලැබිය යුතු මෙන්ම ඒවා ලබා ගැනිමට අවකාශය තිබිය යුතුය.

11 ආපදා වලට මුහුණ දුන් අයගේ ජීවිත යථා තත්ත්වයට පත්කරීමත් , ඔවුන්ගේ ප්‍රජාවන් වඩා සුදානමින් සිටීම සඳහා සංවිධානය කිරීමත් ඉතා අවශ්‍යය.

12 පාලක පක්ෂය මගින් ආරක්ෂක වැටි , සුනාමි පූර්ව අනතුරු ඇඟවිමේ පද්ධති , ඉවත්වී ලැගුම්ගත හැකි ස්ථාන වැනි ආරක්ෂිත ව්‍යුහයන් ස්ථාපිත කිරීම ආපදා අවම කිරීමට බොහෝ ඉවහල් වේ.

13 සාමකාමී හා ආරක්ෂිත ලෝකයක් සියළු මනුෂ්‍ය සංහතියටම අවශ්‍යය.

14 ආසියාවේ තරුණ තරුණියන් වන අපගේ රාජ්‍යයන්ටත්, එක්සත් ජාතීන්ගේ සංවිධානයටත්, රාජ්‍ය නොවන සංවිධාන වලටත්, ප්‍රජාවන්ටත්, ලෝකයේ තාරුණ්‍යයටත්, මෙම ප්‍රකාශනය පිළිගෙන එහි ඇති ආපදා අවම කිරීම සඳහා කර ඇති යෝජනා ක්‍රියාත්මක කිරීමට සහයෝගය ලබාදෙන ලෙස ඉල්ලා සිටිමු.